# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.11.27 පැය 1105 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/151/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**සුනඛයෙකුගේ ගෙළ කඹයකින් සිර කර මරණයට පත් කිරීමකට සම්බන්ධ සැකකාරියක් අත්අඩංගුවට - මාන්කුලම් පොලිස් වසම.**

2025.01.25 වන දින සවස් කාලයේදී මාන්කුලම් පොලිස් වසමේ චෛත්‍යකුලම් ප්‍රදේශයේදී සුනඛයෙකුගේ ගෙළ කඹයකින් සිර කර එම සුනඛයා මරණයට පත් කරන ලද සිදුවීමක් සම්බන්ධයෙන් ඡායාරූප කිහිපයක් සමාජ මාධ්‍ය හරහා සංසරණය විය.

මේ පිළිබඳව මාන්කුලම් පොලිසිය විසින් විමශර්න සිදු කර 2025.01.27 වන අද දින මෙම සිද්ධියට සම්බන්ධ කාන්තාවක් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 48 ක් වන චෛත්‍යකුලම් ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

සැකකාරිය ලංකා දණ්ඩ නීති සංග්‍රහ පනතේ ප්‍රතිපාදන සහ 1907 අංක 13 දරණ සත්ත්ව හිංසා වැළැක්වීමේ ආඥා පනතෙහි ප්‍රතිපාදන යටතේ ගරු අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය. සිද්ධිය සම්බන්ධයෙන් මාන්කුලම් පොලිසිය විසින් වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**